## 2023-01-02 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන**

2022 අතුරු අයවැය මෙන්ම 2023 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කිරීමේදී ද රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන යෝජනාව ගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, දැනටමත් රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ස්ථාපිත කරනු ලැබ ඇත. ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සඳහා අපේක්ෂිත ආයතන අතුරින් ඇතැම් ආයතන රජය සතු සමාගම් වන අතර එවැනි ඇතැම් සමාගම්වල බහුතර කොටස් රජය සතුව පවතී. එසේම, සමහර රාජ්‍ය ව්‍යවසායයන් සංස්ථා වශයෙන් ක්‍රියාත්මක වේ. එම තත්ත්වය යටතේ රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන කඩිනම් කිරීමට හැකි වන පරිදි 100%ක කොටස් හිමිකාරිත්වය භාණ්ඩාගාරයේ ලේකම් සතු වන අයුරින් මහා භාණ්ඩාගාරයට අනුබද්ධිත මව් සමාගමක් ස්ථාපිත කිරීමටත්, ප්‍රතිව්‍යුහගතකරණය සඳහා හඳුනාගනු ලබන රාජ්‍ය ව්‍යවසායයන් එකී මව් සමාගමට අනුබද්ධිත සමාගම් ලෙස ලියාපදිංචි කිරීමටත් අවශ්‍ය විධිවිධාන සැලසීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

02. **ජංගම උපකරණ පිළිබඳ ජාත්‍යන්තර අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කේප් ටවුන් සම්මුතිය සහ ගුවන් යානා උපකරණවලට විශේෂිත වූ කාරණා සම්බන්ධ ජංගම උපකරණ පිළිබඳ ජාත්‍යන්තර අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන සම්මුතිය පිළිගැනීම**

පුද්ගලික නීතිය ඒකාබද්ධ කිරීමේ ජාත්‍යන්තර ආයතනය සහ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ අනුග්‍රහය ඇතිව 2001 වර්ෂයේදී, ජංගම උපකරණ පිළිබඳ ජාත්‍යන්තර අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කේප් ටවුන් සම්මුතිය සහ ගුවන් යානා උපකරණවලට විශේෂිත වූ කාරණා සම්බන්ධ ජංගම උපකරණ පිළිබඳ ජාත්‍යන්තර අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන සම්මුතියට එළඹ තිබේ. එකී සම්මුතිය පිළිගැනීමටත්, ඊට අදාළ විධිවිධාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම

සඳහා අවශ්‍ය නීති සම්පාදනය කිරීම පිණිස පියවර ගැනීමටත් වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **ශ්‍රී ලංකාවෙන් චීනයට අපනයනය කිරීමට නියමිත වන සමුද්‍ර ධීවර ජලජ නිෂ්පාදන පරීක්ෂා කිරීම, නිරෝධායන සහ පශු විද්‍යාත්මක සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා පිළිබඳ වන සන්ධානය**

මෙරට ආහාර නිෂ්පාදන 33ක් චීනයට අපනයනය කිරීම සඳහා චීන සමූහාණ්ඩුවේ සාමාන්‍ය රේගු පරිපාලනය විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අතුරින් නිෂ්පාදන 29ක් ජලජ නිෂ්පාදන වන අතර චීන සමූහාණ්ඩුවේ ලියාපදිංචි ශ්‍රී ලාංකික සමාගම් අතුරින් සමාගම් 38ක් එකී නිෂ්පාදන අපනයනකරුවන් වශයෙන් කටයුතු කරනු ලබයි. චීනය වෙත ජලජ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට සහ දිරි ගැන්වීමට හැකි වන පරිදි ශ්‍රී ලංකාවෙන් චීනය වෙත අපනයනය කිරීමට නියමිත සාගර ධීවර ජලජ නිෂ්පාදන පරීක්ෂා කිරීම, නිරෝධායන සහ පශු විද්‍යාත්මක සෞඛ්‍යාරක්ෂක අවශ්‍යතා පිළිබඳව වන සන්ධානය (Protocol), මහජන චීන සමූහාණ්ඩුවේ සාමාන්‍ය රේගු පරිපාලනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ධීවර අමාත්‍යාංශය අතර අත්සන් තැබීම පිණිස ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීම (6 ශ්‍රේණිය හැර)**

පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම (6 ශ්‍රේණිය හැර) සඳහා දැනට ක්‍රියාත්මක වන චක්‍රලේඛ විධිවිධාන තවදුරටත් විධිමත් කරමින් අතරමැදි ශ්‍රේණිවලදී පාසල් මාරු කිරීමට සත්‍ය වශයෙන්ම අවශ්‍ය කණ්ඩායම් හඳුනාගෙන සියලුම සිසුන්ට සාධාරණ හා සමප්‍රවේශ අවස්ථා සැලසෙන අයුරින් නව ක්‍රමවේදයක් හඳුන්වා දීමටත්, දැනට පවතින 1-5 ශ්‍රේණිවල එක් පන්තියක උපරිම සිසුන් සංඛ්‍යාව 40ක් සහ 6-11 ශ්‍රේණිවල එක් පන්තියක උපරිම සිසුන් සංඛ්‍යාව 45ක් වශයෙන් එම ක්‍රමවේදය යටතේ ද නොවෙනස්ව පවත්වාගෙන යාමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **නාගරික සංවර්ධන අධිකාරිය යටතේ කඩිනම් සේවා ඒකකයක් ස්ථාපිත කිරීම**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික ප්‍රදේශ තුළ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, දැනට ක්‍රියාත්මකව පවතින සංවර්ධන අයදුම්පත් පෙරසැරි කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කර එකම ස්ථානයකින් (One-Stop Unit) සියලු අනුමැතීන් ලබා ගත හැකි වන පරිදි ඒකකයක් ස්ථාපිත කිරීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **බොරැල්ල ඕවල් වීව් රෙසිඩන්සීස් නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක සින්නක්කර පදනම මත විකිණීම**

රාජ්‍ය සේවකයින් සඳහා ඉදිකරන ලද නිවාස ඒකක 608කින් සහ වාණිජ ඒකක 05කින් සමන්විත මහල් 24කින් යුත් පැලැන්ගස්තුඩුව, බොරැල්ල ඕවල් වීව් රෙසිඩන්සීස් නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් කර 2020 වර්ෂයේදී නිවාසවල භුක්තිය නිවාසලාභීන් වෙත ලබා දී ඇත. ඒ අනුව, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන පරිදි නිවාසලාභීන් වෙත සින්නක්කර ඔප්පු ලබා දීම පිණිස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශ්ව කාලාන්තර සමාලෝචනයේ 4 වැනි චක්‍රය**

2006 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් අනුව සියලුම සාමාජික රටවල් විශ්ව කාලාන්තර සමාලෝචනයකට යටත් විය යුතුව ඇත. එමඟින් සාමාජික රටවල මානව හිමිකම් තත්ත්වය වැඩිදියුණු කර ගැනීමට සහ එම රටවල මානව හිමිකම් වගකීම් ඉටු කිරීමට ජාතික මට්ටමින් ගනු ලැබ ඇති පියවර ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දෙනු ලබයි. සෑම සාමාජික රාජ්‍යයක් විසින්ම සිය සමාලෝචනය වර්ෂ 4කට වරක් සිදු කළ යුතුව ඇත. ශ්‍රී ලංකාව මේ වන විට සමාලෝචන චක්‍ර 3කට සහභාගී වී ඇති අතර, ඊළඟ සමාලෝචනය 2023 පෙබරවාරි මස 01 දින පැවැත්වීමට නියමිතව තිබේ. 4වන සමාලෝචන චක්‍රය යටතේ ඉදිරිපත් කිරීමට නියමිත ශ්‍රී ලංකාවේ ජාතික වාර්තාව මඟින් මීට පෙර සිදු කරන ලද සමාලෝචනයේ සිට මේ දක්වා ගනු ලැබ ඇති පියවර සම්බන්ධයෙන්

ස්වයං ඇගයීමක් ඉදිරිපත් කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අනුගමනය කරනු ලැබ ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

08. **1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම - (විෂය අංක 25)**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම සම්බන්ධයෙන් වන විධිවිධාන 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5(1) වගන්තියේ සඳහන් වේ. එහෙත්, එකී විධිවිධාන පරිදි වරාය විෂයභාර අමාත්‍යාංශයේ නියෝජිතයෙකු එම අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසී නොමැත. අදාළ තීරණ ගැනීමේදී විෂයභාර අමාත්‍යාංශයේ නියෝජනයක් පැවතීම වඩාත් යෝග්‍ය බැවින්, ඒ අනුව කටයුතු කිරීමට හැකි වන පරිදි 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 5(1) වගන්තිය සංශෝධනය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **රජයේ ඉඩම් බැහැර කිරීමේ මූලික කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් පමණක් සිදු කිරීම - (විෂය අංක 29)**

දැනට මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ වන ඉඩම් බැහැර කිරීම සඳහා වන බලතල ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් බැහැර කිරීම සඳහා වන බලතල එම කොමිෂන් සභාව වෙත ද පැවරී ඇත. කඩිනම් මහවැලි සංවර්ධනය ව්‍යාපාරය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අදාළ අරමුණු දැනටත් සපුරාගෙන ඇති බැවින් එම ආයතන දෙක මඟින් සිදු කරන රජයේ ඉඩම් බැහැර කිරීම් ද ඇතුළත්ව රජයේ සියලුම ඉඩම් බැහැර කිරීමට අදාළ සියලුම මූලික කටයුතු ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් පමණක් සිදු කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුව තිබේ. ඒ අනුව, රජයේ ඉඩම් බැහැර කිරීමට අදාළ දැනට පවත්නා සියලු නීතිරීති හා රෙගුලාසි අධ්‍යයනය කර, හඳුන්වා දිය යුතු නව නීතිමය සංශෝධනයන්ද ඇතුළත්ව රජයේ ඉඩම් බැහැර කිරීමට අදාළව ප්‍රතිපත්තියක් සකස් කිරීමට සහ අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කර ඉදිරිපත් කිරීමට ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා විසින් ගනු ලැබ ඇති ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

10. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරනු ලැබ ඇති රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද පහත සඳහන් රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* අංක 2309/40 දරන 2022-12-09 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් පනවන ලද 2022 අංක 23 දරන ආනයන හා අපනයන (පාලක) රෙගුලාසි.
* අංක 2311/08 දරන 2022-12-19 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් පනවන ලද 2022 අංක 24 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි.
* අංක 2311/18 දරන 2022-12-21 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් පනවන ලද 2022 අංක 25 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි.

11. **දේශීය වෙළෙඳපොළෙහි පවතින බිත්තර හිඟයට පිළියමක් වශයෙන් බිත්තර ආනයනය කිරීම**

දැනට දේශීය වෙළෙඳපොළෙහි පවතින බිත්තර හිඟය සහ බිත්තර මිල ඉහළ යාමේ ප්‍රවණතාව හේතුවෙන් පාරිභෝගිකයින්ට මුහුණ පෑමට සිදුව ඇති අපහසුතාවට පිළියමක් වශයෙන් අවශ්‍ය වන්නේ නම් රජයේ මැදිහත් වීම මත බිත්තර ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

*************